# පුංචි මලිකි



නේතලී බිහන්සා රසරත්න

# පුංචි මලිති

© නෙතුලි බිහන්සා ජයරත්න

## කතෘගේ වෙනත් කෘති

- අකීකරු පසිඳු,
- බිංදුට පාඩමක්,
- කැලෑ යාලුවෝ

සියලුම හිමිකම් ඇවිරිණි.

ප්‍රථම මුද්‍රණය - 2024
ISBN - 978-624-208-370-4

කතාව හා චිත්‍ර
නෙතුලි බිහන්සා ජයරත්න
6 ශ්‍රේණිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

# පිදුම

ග්‍රන්ථ රචනාකරණයට මා දිරිමත් කළ

ආදරණීය දෙමාපියන්ට,

පවුලේ සියලු දෙනාට හා

ආදරණීය ගුරු මැණීවරුන්ට හා පියවරුන්ට ........

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුග කැපීපෙනෙන්නේද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත් කතුවරියන් සමත් වීම සුවිශේෂී සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණය ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛණකරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,

ශෂිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර.

ඔන්න එකෝමත් එක ගමක

හිටියා මලිති කියලා ළමයෙක්.

එයා ගොඩක් දුප්පත්.

එයාගේ තාත්තා කළේ කුලී වැඩ.



මලිති කවදාවත්ම එක එක දේවල් ඉල්ලලා අම්මාට, තාත්තාට කරදර කළේ නැහැ. එයා ඉගෙනගන්න ගොඩක් දක්ෂයි. ඒ නිසාම පාසලේ ගුරුවරු මලිතිට ගොඩක් ආදරෙයි.



ඒත් මලිතිගේ යාළුවෝ මලිතිට හැම වෙලාවේම විහිළු කළා.



හැබැයි මේ වගේ කතා අහලා මලිති සැලුණේ නෑ. එයා තව තවත් හිත ශක්තිමත් කර ගත්තා.



පාසල් උපකරණ ගන්න ඕනෙ කරන සල්ලි මලිති තනියම හොයාගත්තා. මලිති පාසල් ඇරිලා ගෙදර යන ගමන් පාරේ තියන ලී කුඩු, කුරුලු පිහාටු, පොල් මුඩු වැනි දේවල් එකතු කර ගත්තා.

එයා ගෙදර ගිහිල්ලා ඒවායින් ලස්සන නිර්මාණ කළා. මලිති ඒවා කඩ වීදියේ විකිණුවා.



මලිති ටිකෙන් ටික ලොකු වුණා. එයා දැන් ඉන්නේ පහ වසරේ. එයා තව තවත් උනන්දුවෙන් අධිෂ්ඨානයෙන් ඉගෙනීම් කටයුතු කළා.



ශිෂ්‍යත්ව විභාගය පැවැත්වෙන දවස ආවා. මලිති උදේන්ම නැගිටලා දත් මැදලා මුහුණ සෝදුවා. පාසල් නිල ඇඳුම ඇඳගෙන, අම්මා හදපු කිරිබත් කෑවා.



බුදුන් වැඳලා, මව්පියන්ට වැඳලා පාසල් යන්න පිටත් වුණා. ගෙදරින් පිටත් වෙන්න කලින් අම්මා මලිත්ට පිච්ච මල් දාපු වතුර වීදුරුවක් පෙව්වා.



මලිති තමන්ගේ දැනුමෙන් හොඳින් ම ශිෂ්‍යත්ව විභාගයට ලිවුවා.



මාස කිහිපයක් ගත වුණා. එදා සඳුදා. මලිති උදෙන්ම ඉස්කෝලෙට ගියා. එදා ශිෂ්‍යත්ව ප්‍රතිඵල නිකුත් වෙලා. පන්ති භාර මැඩම් ප්‍රතිඵල අරන් පන්තියට සතුටින් ආවා. මැඩම් ප්‍රතිඵල කියෙව්වා.

"ලකුණු 195 ක් අරන් මලිති වීරරත්න ලංකාවේ ප්‍රථම ස්ථානය ලබා ගෙන තියෙනවා."

මලිතිගේ සතුට නිමහිම නැති වුණා.



මලිති ගෙදර ගිහිල්ලා අම්මාටයි, තාත්තාටයි කිව්වා. දෙමව්පියන්ටත් මලිති ගැන හරි සතුටුයි. මලිතිට විහිළු කරපු ළමයින්ට මලිති හොඳ උත්තරයක් දුන්නා.

නිමි.

ආදර්ශය

උත්සහවන්තයාට කෙදිනක හෝ ජය ලැබේ.



# පුංචි මලිති

## නෙතුලි බිහන්සා ජයරත්න

### පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල්, කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක් වීමත් සමඟ දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතුවී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වේ. මීට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනවිරත්න මහලේකම්

ISBN - 978-624-208-370-4

9 786242 083704

©කතෘ ප්‍රකාශනයකි.